# සිංහල



## නාම පදය කෙරෙහි බලපාන රූප භේදය


Copyright © e-thaksalawa.moe.gov.lk

නාම පදයක් වාක්‍යයක යෙදීමේ දී එම නාම පදය උක්ත රූපයෙන් යෙදිය යුතු ද අනුක්ත රූපයෙන් යෙදිය යුතු ද යන්න ගැන දැනුවත් විය යුතු වන්නේ උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ රීති අධ්‍යයනය කිරීමෙනි.

වාක්‍යයක් තුළ යෙදෙන නාම පදය අර්ථවත් වන ආකාරය අනුව නාම පදයේ උක්ත රූපය හෝ අනුක්ත රූපය යොදන්නට අප එම රූප දෙක හඳුනා ගත යුතු ය.

රූප භේදය බලපාන නාම පද කාණ්ඩ කීපයකි.

1. ප්‍රාණවාචී බහුවචන නාම පද
2. ප්‍රාණවාචී සර්ව නාම පද
3. ප්‍රාණවාචී සර්වනාම සමූහාර්ථ පද
4. ප්‍රාණවාචී අනියමාර්ථ ඒකවචන නාම පද
5. ප්‍රාණවාචී රූප ගැන්වූ අප්‍රාණවාචී නාම පද

# ප්‍රාණවාචී බහුවචන නාම පද

| නාම පද වර්ගය | උක්ත රූපය | අනුක්ත රූපය |
|---|---|---|
| 1. ප්‍රාණවාචී බහුවචන නාම පද | මිනිස්සු | මිනිස්සුන් |
| | ගුරුවරු | ගුරුවරුන් |
| | කාන්තාවෝ | කාන්තාවන් |
| | ළමයි | ළමයින් |
| | ගවයෝ | ගවයන් |
| | බල්ලෝ | බල්ලන් |

# ප්‍රාණවාචී සර්ව නාම පද

| නාම පද වර්ගය | උක්ත රූපය | අනුක්ත රූපය |
| --- | --- | --- |
| **2. ප්‍රාණවාචී සර්ව නාම පද** | | |
| උත්තම පුරුෂ | මම | මා |
| | අපි | අප |
| | තෝ | තා |
| මධ්‍යම පුරුෂ | තෙපි/තොපි | තොප |
| | ඔබ | ඔබ |

ඉතිරිය

# ප්‍රාණවාචී සර්ව නාම පද

| නාම පද වර්ගය | උක්ත රූපය | අනුක්ත රූපය |
|---|---|---|
| 2. ප්‍රාණවාචී සර්ව නාම පද | | |
| ප්‍රථම පුරුෂ | ඔහු | ඔහු |
| | ඔවුහු | ඔවුන් |
| | හේ | ඔහු |
| | හෙතෙම | |
| | හෙතෙමේ | |
| | හේ තෙමේ | |
| | ඕ/ඕ තොමෝ | ඈ/ඈය |

# ප්‍රාණවාචී සර්වනාම සමූහාර්ථ පද

| නාම පද වර්ගය | උක්ත රූපය | අනුක්ත රූපය |
|---|---|---|
| 3. ප්‍රාණවාචී සර්වනාම සමූහාර්ථ පද | | |
| | ඇතැම්හු | ඇතැමුන් |
| | සමහරු | සමහරුන් |
| | කවුරු | කවුරුන් |
| | ඇතැමෙක් | ඇතැමෙකු/ඇතැමකු |
| | සමහරෙක් | සමහරෙකු/සමහරකු |
| | යමෙක් | යමෙකු/යමකු |
| | කිසිවෙක් | කිසිවෙකු/කිසිවකු |
| | අයෙක් | අයෙකු/අයකු |
| | කවරෙක් | කවරෙකු/කවරකු |
| | කෙනෙක් | කෙනෙකු/කෙනකු/කෙනෙකුන් |

# ප්‍රාණවාචී අනියමාර්ථ ඒකවචන නාම පද

| නාම පද වර්ගය | උක්ත රූපය | අනුක්ත රූපය |
|---|---|---|
| **4. ප්‍රාණවාචී අනියමාර්ථ ඒකවචන නාම පද** | | |
| ස්ත්‍රී ලිංග | කාන්තාවක් | කාන්තාවක |
| | ගුරුවරියක් | ගුරුවරියක |
| | නිළියක් | නිළියක |
| | දෙනක් | දෙනක |
| පුරුෂ ලිංග | මිනිසෙක් | මිනිසකු/මිනිසෙකු |
| | ගුරුවරයෙක් | ගුරුවරයකු/ගුරුවරයෙකු |
| | නළුවෙක් | නළුවකු/නළුවෙකු |

# ප්‍රාණවාචී රූප ගැන්වූ අප්‍රාණවාචී නාම පද

| නාම පද වර්ගය | උක්ත රූපය | අනුක්ත රූපය |
|---|---|---|
| 5. ප්‍රාණවාචී රූප ගැන්වූ අප්‍රාණවාචී නාම පද | | |
| | ගංගාවෝ | ගංගාවන් |
| | තාරකාවෝ | තාරකාවන් |
| | රිතීහු | රිතීන් |
| | හේතූහු | හේතූන් |
| | | |

(නාම පදයේ උක්ත රූපය යෙදෙන අවස්ථා සහ අනුක්ත රූපය යෙදෙන අවස්ථා ගැන අවබෝධ කර දීම සඳහා සිංහල ලේඛන රීතිය පොතෙහි 51 පිටුවේ 2.1.1 සිට 63 පිටුව දක්වා ඇතුළත් කරන්න.)